**<u>ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021(2024)</u>**

විභාග කොමසාරිස් ජනරාල් විසින් 2024.03.17 දින පවත්වන ලද උක්ත තරග විභාගයේ ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් 408 දෙනෙකුගේ නාමලේඛනය මෙමගින් ප්‍රකාශයට පත්කරනු ලබන අතර එහිදී පහත කරුණු කෙරෙහි විශේෂිතව අවධානය යොමු කරවනු ලැබේ.

1. මෙම විභාගයට පෙනී සිට එක් එක් විෂයය සඳහා ලකුණු 40% ට නොඅඩුව ලැබූ හා විභාගයේ මුළු ලකුණු ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 50%ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් අයදුම්කරුවන් හාරසිය හතර දෙනෙකුගේ (404) සහ ආබාධිත පදනම යටතේ සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් හතර (04) දෙනෙකුගේ නාම ලේඛනය කුසලතා අනුපිළිවෙලට සකසා ඇත.

2. සම්මුඛ පරීක්ෂණයේ දී, අපේක්ෂිත මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ තනතුරකට පත් කරනු ලැබේ.

3. ආබාධිත පදනම යටතේ සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ සුදුසුකම් සපුරා ඇත්නම් පමණක් වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කර එම මණ්ඩලයේ නිර්දේශය අනුව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ තනතුරකට පත් කරනු ලැබේ.

4. එබැවින් මෙම ප්‍රතිඵල ලේඛනයේ නම සඳහන් වීම පමණක්, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ පත්වීමක් ලබා ගැනීම සඳහා වන සුදුසුකමක් නොවන බව අවධාරණය කරනු ලැබේ.

5. මෙම නිලධාරීන් සඳහා සම්මුඛ පරීක්ෂණය **2024.10.05 සහ 06** දෙදින මෙම අමාත්‍යාංශයේ දී පැවැත්වීමට නියමිත අතර සුදුසුකම් ලද එක් එක් අයදුම්කරුවන්ට අදාළ සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දිනය සහ වේලාව පහත ලේඛනයේ පළ කර ඇත. නියමිත දින නියමිත වේලාවට සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වන ලෙස මෙයින් දනුම් දෙනු ලැබේ.

6. සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් ලිපි එක් එක් නිලධාරියා වෙත තැපෑලෙන් යොමු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන විට පහත සඳහන් ලියකියවිලි රැගෙන ආ යුතු ය.

   I. උප්පැන්න සහතිකය

   II. විභාග නිවේදනයේ සඳහන් 7.0 (ඉ) සහ (ඊ) හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය සුදුසුකම් අතුරින් ඔබ විසින් සපුරා ඇති සුදුසුකම් සනාථ කෙරෙන සහතික